**ඉංජිනේරු සේවා චක්‍රලේඛ: 33**

මගේ අංකය : ES/ J / 05 (II)
ඉංජිනේරු සේවා අංශය
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013-12-24

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සේවයේ යොදවා ඇති,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත

**රා.පරි. චක්‍රලේඛ 06/2006 අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම**
**(අංක 1836/6 - 2013.11.11 දිනැති සහ අංක 1840/2 – 2013.12.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර)**

අංක 1836/6 – 2013.11.11 දිනැති සහ අංක 1840/2 – 2013.12.09 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රවල පළකරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2006.01.01 දින සිට ක්‍රියාත්මක වේ. එසේ වුවද 2006.01.01 දිනට පෙර පැවති සේවා ව්‍යවස්ථාව යටතේ ඉටුවිය යුතුව තිබූ නොනිමි කාර්යයන් ද සම්පූර්ණ කළ යුතු වේ.

**02. චක්‍රලේඛයේ විධි විධාන නිලධරයන්ට දැන්වීම**

ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ සේවයේ නියුතු සියලුම ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් දැනුවත් කර, මේ සමග ඇති ආකෘති පත්‍රය (Annexe 01) සම්පූර්ණ කර අදාල ලිපි ලේඛනවල පිටපත්ද සමග ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට දැන්විය යුතුය. විදේශ සේවයේ නියුතු, දීර්ඝකාලීන විදේශ නිවාඩු ලබා සිටින, විධිමත් ලෙස විදේශ නිවාඩු ලබා විදේශගතව සිටින වෙනත් ආයතන වලට තාවකාලිකව මුදා හැර ඇති, වැඩ තහනම් කර ඇති සහ සේවය අත්හිටුවා ඇති නිලධරයන්ට ද ඔවුන් විසින් අවසන් වරට දැනුම් දී ඇති ලිපිනයන් වලට ලියාපදිංචි තැපැලෙන් මේ බව දන්වා යැවිය යුතු වේ.

**03. අන්තර්ග්‍රහණය**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ දැනට සේවයේ නියුතු පත්වීම්ලාභී නිලධරයන් ඉහත ව්‍යවස්ථා සංග්‍රහයට අනුව ඔවුන් අදාල වන ශ්‍රේණීන් වෙත අන්තර්ග්‍රහණය කළ යුතු වන බැවින්, මේ සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර, තම ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිටදී අත්සන් තබා දෙපාර්තමේන්තු ප්‍රධානී වෙත ඉදිරිපත් කරන මෙන් ඔවුන් වෙත දැන්විය යුතුය. අනතුරුව දෙපාර්තමේන්තු ප්‍රධානී/

අමාත්‍යාංශ ලේකම්/ පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් එම ආකෘති පත්‍රයේ මුල් පිටපත තම නිර්දේශ ද සහිතව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

මේ සමග ඇති ආකෘති පත්‍රයෙහි A (personal data) කොටස සහ නිලධාරියා දැනට සිටින පන්තිය/ශ්‍රේණිය අනුව අදාලවන කොටස සම්පූර්ණ කිරීමෙන්, ඔවුන් මෙකී ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළකළා සේ සැළකෙන අතර, එයින් එම නිලධාරීන් නව ව්‍යවස්ථාව යටතේ අදාල වන පරිදි එක් එක් ශ්‍රේණීන් යටතේ අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කෙරෙනු ඇත. තවද යම් නිලධාරියෙක් එකී අන්තර්ග්‍රහණයට කැමැත්ත පළ නොකර විශ්‍රාම ගැනීමට අදහස් කරන්නේ නම්, ඔහු විසින් මෙම ආකෘති පත්‍රයෙහි A (personal data) කොටස සම්පූර්ණ කර, එම කොටසෙහිම 28 වන කරුණ යටතේ (item No.28 of A- personal data) ඒ සඳහා තම මනාපය පළකල හැක. විශ්‍රාම ගැන්වීමට මනාපය පළකරනු ලබන නිලධාරීන් ඒ අනුව විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

**04. <u>මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීම</u>**

I. නිලධරයන් විසින් භාරදෙනු ලබන ඉහත අකාති පත්‍රය ප්‍රකාර වූ මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් පහත දැක්වෙන කරුණු සැළකිල්ලට ගත යුතුය.

(අ) ප්‍රකාශ පත්‍රයේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බව සහ ඔහු එහි සඳහන් වන දිනයේ දී ප්‍රකාශය සහතික කරන නිලධරයා ඉදිරිපිටදී අත්සන් කළ බව.

(ආ) සහතික කරන නිලධරයා, දිනය යොදමින් සහතික කර අත්සන් තබා දින මුද්‍රා/ නිලමුද්‍රා තබා ඇති බව

(ඇ) ප්‍රකාශ පත්‍රයේ අනු පිටපතක් නිලධරයාගේ දෙපාර්තමේන්තු පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුලත් කර ඇති බව.

II. විදේශගත නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර එරට ශ්‍රී ලංකා තානාපති කාර්යාල ප්‍රධානයන් ඉදිරිපිටදී අත්සන් කර සහතික කර එහි මුල් පිටපත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ හැක.

**05. <u>මනාපය ප්‍රකාශ නොකරන නිලධරයන්</u>**

මෙම චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කිරීමෙන් පසුව යම් නිලධාරියෙක් මෙම ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් නොකරන්නේ නම් එම නිලධාරීන්ගේ නාම ලේඛනයක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත එවීමට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළයුතු වේ.

**06. විශ්‍රාම ගැනීමේ විකල්පය**

ක්‍රියාත්මක දිනය වන විට සේවයේ නියුතුව සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධාරියෙකු හට ඔහු විසින් කරනු ලබන ඉල්ලීමක් මත විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමට මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙනු ලැබේ. එවන් සහනයක් පිරිනැමිය යුතු තරමට මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලින් අහිතකර බලපෑමක් ඇතිවී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් මෙම ව්‍යවස්ථාව ප්‍රසිද්ධියට පත්කළ දිනයේ සිට අවුරුදු 05ක් ඇතුලත ඔහුට/ ඇයට එම මනාපය ප්‍රකාශ කළ හැකිය.

**07. නිපුණතා සංවර්ධන සහ වරලත් ඉංජිනේරු තත්වය සඳහා පුහුණුව**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 12.2 අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා කෙටි කාලීන සේවාස්ථ පුහුණුවක් ලබා දිය යුතුය. මෙම පුහුණුව දෙපාර්තමේන්තුවේ කාර්ය පටිපාටි, ආයතන රෙගුලාසි හා මුදල් රෙගුලාසි යනාදී විෂයයන් ඇතුලත් වන සේ ලබා දෙනු ලබන කෙටි කාලීන පුහුණුවකි. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් ඔවුන් අදාල වන ක්ෂේත්‍රයන් අනුව (සිවිල්, යාන්ත්‍රික, විදුලි හා රසායන) එක් එක් කාණ්ඩ යටතේ වර්ගීකරණය කර (සිවිල් -1, 2,..., යාන්ත්‍රික - 1,2..., විදුලි 1,2,3 හා රසායන 1) ඊට අදාල දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කරනු ලබයි. එපරිදි කාණ්ඩයන්ට වෙන්කර අදාල අමාත්‍යාංශවලට / දෙපාර්තමේන්තුවලට/ පළාත් සභාවලට අනුයුක්ත කරනු ලබන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා මෙම පුහුණුව ලබා දීම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතු වගකීමක් වේ.

තවද පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් ඉංජිනේරු තත්වය) අඛණ්ඩව පවත්වාගෙන යාම ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සියලුම ශ්‍රේණිගත උසස්වීමක් සඳහාම අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. පූර්ණ වෘත්තීය සුදුසුකම් ලැබීම සඳහා ඉංජිනේරුවකු සේවයට බැඳී සිව් වසරක සේවා කාලයක් තුල ඉංජිනේරු නිර්මාණකරණය (Engineering Designs ) පිළිබඳ මාස 12ක් (අවම මාස 06 බැගින් වාර දෙකකදී) වරලත් ඉංජිනේරුවරයෙකු යටතේ ඒ සඳහා අනුමත ආයතනයක පුහුණුව ලැබිය යුතු වේ. එම පුහුණුව ලැබීම සඳහා අවකාශ ලබා දීම ද ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වේ.

**08. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**

ඉහත 07 හි සඳහන් සේවාස්ථ පුහුණුවට සමගාමීව සෑම නිලධාරියෙකුටම රා.පරි. චක්‍රලේඛ 07/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය ලබා ගැනීමට හැකිවන පරිදි පුහුණුවක් ලබා ගැනීමට පහසුකම් සළසා දීම ද දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතු වගකීමකි.

තවද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් ඔවුන් අදාල වන ක්ෂේත්‍රයන් අනුව එක් එක් කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඊට අදාල දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කරනු ලබන බැවින්,

දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර ස්ථාන මාරුකිරීම් සිදුකරන විට සියලුම ඉංජිනේරුවන්ට රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම පහසුකරන අන්දමේ ස්ථානමාරු ක්‍රියාවලියක් අනුගමනය කිරීමටද දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

ඉහත සඳහන් අංක 1836/6 – 2013.11.11 දිනැති සහ අංක 1840/2 – 2013.12.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන් www.documents.gov.lk යන වෙබ් අඩවියෙන් බා ගත හැක.



**ආර්.ඒ.ඩී.ජයන්ති,**
**ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ**

**අ/කලේ, පී.බී. අබේකෝන්**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

**Annex 01**

**Application for the absorption/promotion to the Sri Lanka Engineering Service (SLES) as per the service minute published in the Gazette Extra Ordinary of the Democratic Socialist Republic of Sri Lanka No. 1836/6 dated 11-11-2013 and No 1840/2 dated 09-12-2013**

## A - Personal Data

**01.** Name in Full (As per the appointment letter): ................................................

..................................................................................................................

**02.** Name with initials (As per the appointment Letter): ..........................................

**03.** Name in Full (If the name is changed): .......................................................

..................................................................................................................

**04.** Name with initials (If the name is changed) : ................................................

**05.** NIC Number (The copy is attached): ...........................................................

**06.** Date of Birth: ..................................................................

**07.** Place of work (Department/Ministry/Provincial council/Province):

..................................................................................................................

**08.** Official Address: ..........................................................................

..................................................................................................................

**09.** Postal Address: ............................................................................

..................................................................................................................

**10.** Contact Number Office: ...................... Mobile: ................................

**11.** Date of appointment (In the SLES): .........................................................

**12.** Present Class/Grade: .....................................................................

**13.** Group (Civil 1, Civil 2….. Mechanical 1…, Electric 1 .., Chemical 1): .................

**14.** Date of confirmation: ......................................................................

**15.** Date in which the full professional qualification was obtained (The copy of the certificate is attached herewith): ...............................................................

**16.** Date in which the "Fellow" membership of the Institution of Engineers, Sri Lanka (IESL) or Any Institution recognized by the IESL; was obtained:.......................

**17.** Post graduate Degree/ Diploma

a. Post graduate degree/ Diploma obtained: ............................................
b. University/ Institution: ...................................................................
c. Effective Date of the Degree/ Diploma: ..............................................

1

**18.** Date of Promotion to Class II Grade I: ..........................................................

**19.** Date of Promotion to Class I (Supernumerary): ............................................

**20.** Date of Promotion to Class I: ....................................................................

**21.** Date of Promotion to Special Grade (The certified copy of the letter of appointment is attached): .....................................................................................................

**22.** Number of years service at the date of 01-01-2006: .......................................

**23.** No pay leave if any:

| **Date** | | **Period in Yrs/Months/days** | | |
|---|---|---|---|---|
| **From** | **To** | **Years** | **Months** | **Days** |
| | | | | |
| | | | | |

**24.** Number of salary increment earned in the present Class/ Grade: ..........................

**25.** The current salary level or point: ..............................................................

**26.** Whether the officer has been subjected to any disciplinary inquiry: .......................

**27.** Whether there is any disciplinary inquiry pending against the officer: ....................

**28.** Requests for approval to retire from the Sri Lanka Engineering Service as per the provision given under the Section 18 of Gazette Notification No 1836/6 dated 11-11-2013 (Yes/No) : ...........................................................................

## B - Absorption and Promotions

1. **The following data should be provided by the officers who were in Class II Grade II at the date of 01-01-2006.**

**1.1.** First efficiency bar examinations

| **Exam** | **The date in which the exam was successfully completed** |
|---|---|
| Administration | |
| Financial Regulation | |
| Departmental Procedure | |
| $2^{nd}$ language Oral test (Tamil/Sinhala) | |

**Note:** The copies of the result sheets are attached.

**1.2.** The date in which the satisfactory service of 10 years was completed: .................

**1.3.** Whether the officer has earned salary increments during 5 years immediately prior to the effective date of promotion to the Class II Grade I (The officers who are recruited 22-07-2004) : ..............................................................

**1.4.** Whether the officer has been subjected to any punishment under any disciplinary inquiry during the 5 years prior to the effective date of promotion to the Class II Grade I: ....................................................................................

**1.5.** Whether the officer is maintaining the "Corporate" or "Fellow" membership of IESL as a chartered Engineer (The letter issued by the Institution is attached): ................

**2. The following data should be provided by the officers who were in Class II Grade I at the date of 01-01-2006.**

**2.1.** Salary Increments

**2.1.1.** Whether the officer has earned salary increments during the 5 years immediately prior to the date of 01-01-2006 (Date of promotion to Class II Grade I is before 01-01-2006): .......................................................

**2.1.2.** Whether the officer has earned salary increments during the 5 years immediately prior to the date of promotion to the Class II Grade I (Date of promotion to Class II Grade I is after 01-01-2006): ................................

**2.2.** Disciplinary Inquiry

**2.2.1.** Whether the officer has been subjected to any punishment under any disciplinary inquiry during the 5 years prior to the date of 2006-01-01 (Date of promotion to Class II Grade I is before 01-01-2006): ................................

**2.2.2.** Whether the officer has been subjected to any punishment under any disciplinary inquiry during the 5 years prior to the date of promotion to the Class II Grade I (Date of promotion to Class II Grade I is after 01-01-2006): .........

**2.3.** Whether the officer is maintaining the "Corporate" or "Fellow" membership of IESL as a chartered Engineer from the date of promotion to the Class II Grade I (The letter issued by the Institution is attached): ................................................

**3. The following data should be provided by the officers who were in Class I at the date of 01-01-2006.**

**3.1.** Whether the officer has completed active and satisfactory service of 05 years in Class I of SLES: ...............................................................................

**3.2.** Whether the officer has earned 05 salary increments after being promoted to Class I of SLES: .................................................................................

**3.3.** Date in which the officer has completed 18 years of active period of service: ..........

**3.4.** Whether the officer has proved annual performance at satisfactory or above level during the period of 05 years immediately preceding the date of full filling the requirements for the promotion to the Special Grade: ………………………………..

**3.5.** Whether the officer has completed a satisfactory service of 05 years immediately preceding the date of full filling the requirement for the promotion to the Special Grade and not being subjected to any Disciplinary punishment: ……………………

**3.6.** Please specify the qualification obtained to fulfill the requirement stated under the clause 10.3.1(v) of the service Minutes of SLES (The certified copy of the certificate is attached): ……………………………………………………………………………

**3.7.** Whether the officer is maintaining the "Corporate" or "Fellow" membership of IESL as a chartered Engineer (The letter issued by the Institution is attached): ……………

I hereby certify that the particulars furnished by me in this application are true and accurate to the best of my knowledge. I also aware that if any of the particulars furnished by me in this application is found to be false or incorrect, I am liable to be disqualified if detected before granting absorption/promotion to the next Grade or subject to disciplinary actions if detected after the absorption/ promotion.

……………………. ………………………………….
Date Signature of the applicant

**Recommendation of the Head of the Department**

This is to certify that the details and information furnished by Eng (Mr/Mrs./Miss) …………………………………………………………………..in this application are true and accurate in accordance with data available in the personal file maintained by the organization. Therefore absorption/promotion to Grade III/Grade II/Grade I/Special Grade of the Sri Lanka Engineering Service is recommended.

Date: ……………………  ……………………………………..
Signature of Head of the Organization

Official stamp

* ***Note**: In case of officers attach to Provincial Councils/ Local Authorities; signature of the Chief Secretary is required*